# පැරණි පුස්කොළ පොත් කම්බා තුළින් හෙළිවන සිතුවම් කලාව පිළිබඳ අධ්‍යයනයක්

උල්පතගම සුගතරතන හිමි[1]

## හැඳින්වීම

පුරාණ ශ්‍රී ලංකාවේ ලේඛන ද්‍රව්‍යයක් ලෙස පුස්කොළ පොත් භාවිත කරන ලදී. අතීතයේ ලේඛන මාධ්‍යයක් ලෙස භාවිත කිරීම සඳහා විශේෂිත තාක්ෂණයකට අනුව සකස් කරන ලද තල්පත්‍ර වේ. පුස් යන්නෙහි අර්ථය "හිස්" යන්නයි. එනම්, අකුරු ලිවීමට පෙර සකස් කරගන්නා ලද හිස් තල්පත්‍ර පුස්කොළ ලෙස හඳුන්වයි. අතීතයේ ශ්‍රී ලංකාවේ සහ තවත් දකුණු ආසියාතික රටවල ලේඛන කටයුතු සඳහා භාවිත කළ සකස් කරගත් තල කොළ විශේෂයකි. කඩදාසි භාවිතයට පැමිණීමට පෙර අපේ රටේ ධර්ම ග්‍රන්ථ, වෙද පොත්, නක්ෂත්‍රය සහ ඉතිහාසය ලේඛනගත කිරීමට යොදාගත්තේ මෙම පුස්කොළයි. පුස්කොළ පොතේ ප්‍රධාන ලක්ෂණයක් ලෙස සිතුවම් කලාව පෙන්වාදිය හැකිය. පුස්කොළ පොත් කම්බා සිතුවම් යනු ශ්‍රී ලාංකේය සාම්ප්‍රදායික කලා ශිල්ප අතර සුවිශේෂී ස්ථානයක් හිමි කරගන්නා, පුස්කොළ පොත්වල බාහිර ආරක්ෂාව සහ අලංකරණය වෙනුවෙන් නිර්මාණය වූ සෞන්දර්යාත්මක අංගයකි. පුස්කොළ සිතුවම් කලාව ප්‍රධාන වශයෙන් කොටස් දෙකක් හඳුනාගත හැකිය. එනම් පුස්කොළ කම්බය මත හා පත්තිරු මත සිතුවම්කරණයයි. ලේඛන කලාවේ ප්‍රබෝධයත් සමඟ මෙම කලාව දියුණුවට පත් වී ඇත. මෙම පර්යේෂණ ගැටලුව වනුයේ ශ්‍රී ලංකාවේ සිතුවම්කරණය තුළ කම්බා සිතුවම්කරණයට හිමිවන ස්ථානය කෙබඳු ද? යන්නයි.

## අරමුණ

කම්බා සිතුවම්කරණය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙහි පර්යේෂණ අරමුණයි.

## ක්‍රමවේදය

මෙහි දත්ත රැස් කිරීමේ ක්‍රමවේද ලෙස මූලාශ්‍රය අධ්‍යයනය, ක්ෂේත්‍ර නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා හා කේවල අධ්‍යයන ආදිය විධික්‍රම යොදා ගන්නා ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

පුස්කොළ පොත් සිතුවම් කලාව යනු ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික චිත්‍ර කලාව තුළ හමුවන අතිශය සුවිශේෂී සහ සියුම් කලාවකි. අතීතයේදී ධර්ම ග්‍රන්ථ, වෛද්‍ය විද්‍යාව, ජ්‍යොතිෂය සහ ඉතිහාසය ලේඛනගත කිරීම සඳහා පුස්කොළ භාවිතා කළ අතර, ඒවා වඩාත් අලංකාරවත් කිරීමට මෙම සිතුවම් කලාව යොදා ගැනුණි. ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් කලාව අනුරාධපුර යුගය දක්වා දිවයන නමුත්, වර්තමානයේ ශේෂව පවතින සිතුවම් සහිත පුස්කොළ පොත් බොහොමයක් මහනුවර යුගයට (17-18 සියවස්) අයත් වේ.

1 පුරාවිද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, හෝමාගම, ශ්‍රී ලංකාව.
ulpathagamasugatharathana@gmail.com

විශේෂයෙන්ම බුදු දහමේ පුනර්ජීවනයත් සමඟ විහාරස්ථාන කේන්ද්‍ර කරගනිමින් මෙම කලාව ප්‍රචලිත විය. පුස්කොළ සිතුවම් කලාව ප්‍රධාන වශයෙන් කොටස් දෙකක් වශයෙන් හඳුනාගත හැකිය. එනම් පුස්කොළ කම්බය මත හා පත්තිරු මත සිතුවම්කරණයයි. ලේඛන කලාවේ ප්‍රබෝධයත් සමඟ මෙම කලාව දියුණුවට පත් වී ඇත. පුස්කොළ පොත්වල වැදගත් අංගයක් ලෙස කම්බාව හඳුන්වා දිය හැකිය. පුස්කොළ පොතක ආරක්ෂාව සඳහා දෙපසට යොදන ලී, ඇත්දත් හෝ ලෝහ පටි 'කම්බා' ලෙස හැඳින්වේ. කම්බාව යනු පොතේ පවතින පිටකවරය යි. පොතේ ආරක්ෂාවට මෙන්ම අලංකරණය සඳහා ද මෙය යොදා ගැනේ. ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත්වල කම්බාවේ හා පත්තිරු මත සිතුවම් නිර්මාණය කොට තිබෙන අතර පුස්කොළ පොත්ගුල් තුළ අධ්‍යයනය කිරීමේදී සිතුවම්කරණය දක්නට ලැබේ. චුල්ලවග්ගපාළි පුස්කොළ අත්පිටපතේ පොත් කම්බයේ විවිධ වර්ණයන්ගෙන් යුක්ත සිතුවම් දැකීමට ඇති අතර, එම අවධියේ ම කරන ලද සාරත්ථදීපනි විනයටීකා පුස්කොළ පොත් කම්බයේ ඒක වර්ණ සිතුවම් දැකීමට හැකි ය. ජාතක කතා, වෙදකම්, බුද්ධ චරිතය, පිරුවානා පොත් වහන්සේ ආදී පුස්කොළ පොත්වල විවිධ සිතුවම් දක්නට ලැබේ. පොත් කම්බා කැටයම් සහිත හා රහිත ලෙස නිර්මාණය කර ඇත. දැව, ඇත් දත්, සත්ව හම්, ලෝහ වර්ග (රත්රන්, රිදී, තඹ, පිත්තල) හා තල පත්තිරු කම්බා නිර්මාණකරණයේ දී මාධ්‍ය ලෙස භාවිතා කර ඇත. ඇතැම් කම්බා තුල සිතුවම්කරණ සිදුව ඇති ආකාරයක් දැක ගත හැකි ය. පොත් කම්බා පමණක් නොව එහි අන්තර්ගත පත්තිරුවල ද සිතුවම් ඇඳීමේ තාක්ෂණයක් පැවැති බවට සාධක පවතී. කම්බා සිතුවම් පුස්කොළ පොත් නිර්මාණ ශිල්පීන්, ලාක්ෂා හා සිත්තර ශිල්පීන් විසින් කරන්නට ඇත. පොත් කම්බාවල වර්ෂ භාවිතයෙන් සිතුවම් ඇඳීමේ දී තෙලිකුරු භාවිතා කර ඇති අතර ලාක්ෂා භාවිතයෙන් කම්බා අලංකාර කිරීමේ දී නියපොතු වැඩ නැමැති ශිල්ප ක්‍රමය භාවිතා කර ඇත. කම්බා ඇතුල් පැත්තේ සමතලා පුවරුවේ විවිධ සිතුවම් ඇඳ ඇත. ස්තූප, මල් වර්ග, බුද්ධ චරිතයේ විවිධ අවස්ථා, සොළොස්මස්ථාන හා ශ්‍රාවක චරිත, මෝස්තර ආදී විවිධ රූප ඒ අතර වේ. ඇතැම් කම්බා දෙපස ම මල් ලියකමින් අලංකාර කර ඇත. එසේම දිව්‍ය ප්‍රභවය සහිත නිර්මාණ, මනුෂ්‍ය රූප, සත්ත්ව රූප, පක්ෂි රූප වෘක්ෂලතා හා ජ්‍යාමිතික මෝස්තර ආදී සම්මත මෙන් ම මිථ්‍යා රූප ද කම්බා සිතුවම් අතරට එක් කර තිබේ. සිතුවම් ඇඳීම සඳහා පන්හිඳ හෝ සිහින් පින්සල භාවිත කරන ලදී. පන්හිඳෙන් සීරීමෙන් පසුව ඒ මත 'දුම්මල තෙල්' ගැල්වීමෙන් රේඛා මතු කර ගැනීම සාමාන්‍ය ක්‍රමයයි. කම්බා සිතුවම් වර්ණ ගැන්වීමේ දි කහ, කළු, සුදු, රතු සහ කොළ ආදී වර්ණ බහුල වශයෙන් භාවිත වූ බව පෙනේ. මෙම සිතුවම් සඳහා ස්වභාවික අමුද්‍රව්‍යවලින් නිපදවා ගත් වර්ණ භාවිත කරන ලදී. ඒ මෙසේ ය.

රතු / සාදිලිංගම්

කහ / හිරියල්

කළු / දුම්මල තෙල් සහ අඟුරු මිශ්‍රණය

කොළ / ගොකටු කිරි සහ නිල් අවරිය  ආදි වශයෙනි.

කොළඹ ජාතික කෞතුකාගාරය, ජාතික ලේඛනාගාරය, පේරාදෙණි විශ්ව විද්‍යාලය, පැල්මඩුල්ල රජමහා විහාරය, ගල්ලෙන්ගොඩ පොත්ගුල් විහාරය, අලුවිහාරය, අස්ගිරිය හා මල්වත්ත විහාරය හඟුරන්කෙත පොත්ගුල් මාලිගා මහා විහාරය, ඇත්කඳ

විහාරය ආදී බොහෝ ස්ථානවල සිතුවමින් අලංකාර වූ කම්බා සහිත පුස්කොළ පොත් දැක ගැනීමට හැකිය. මෙය හුදෙක් අලංකාරය සඳහා පමණක් නොව ලාංකීය අනන්‍යතාවය පැරණි ඇඳුම් පැළඳුම්, ගෘහ නිර්මාණ ශිල්පය සහ එකල පැවති සමාජ ක්‍රමය අධ්‍යයනය කිරීමට ඇති ඉතා වටිනා මූලාශ්‍රයකි. ඉහත සඳහන් කරන ලද විහාරස්ථාන අතුරින් සෑම විහාරස්ථානයකම පුස්කොළ පොත් කම්බා තුළ සිතුවම් නිර්මාණය කොට තිබෙන අතර ඒ අතරින් සුවිශේෂිත ස්ථානයක් හිමිවන විහාරස්ථානයක් ලෙස ඇත්කඳ විහාරයේ පුස්කොළ පොත් හඳුන්වා දිය හැකිය. මෙම විහාරය සතුව පවතින පුස්කොළ ග්‍රන්ථ ප්‍රමාණය 363 කි. ඇත්කඳ විහාර පුස්කොළ ලේඛන එකතුවෙහි පොත් කම්බා තුළ විවිධ සැරසිලි හා මෝස්තර දක්නට ලැබේ. එම සැරසිලි හා මෝස්තර අතර වැඩි වශයෙන් වාටි මෝස්තර, ලියවැල, මල් මෝස්තර, ලැටිස් මෝස්තර, සහ ලණු ගැටය දක්නට ලැබේ. සැරසිලි මෝස්තර කොටස් කිහිපයක් යටතේ වර්ග කිරීමට ඉඩ තිබේ. ආගමික සංකල්ප, තිරිසන් සතුන්, වෘක්ෂලතා, ජ්‍යාමිතික හැඩතල වශයෙනි. ආගමික සංකල්ප දැක්වීමේදී බුද්ධරූපය නෙළුම් මල මගින් නිරූපණයේ කොට ඇති අතර තිරිසන් සතුන් දැක්වීමේදී හංස මෝස්තර දක්නට ඇත. සම්මත මල් රටා අතර නෙළුම් මල, පිච්ච මල, අට පෙතියා මල, ප්‍රධාන වේ. පලාපෙති, චතුරස්‍රය, ත්‍රිකෝණය, අටපට්ටම් රවුම, ගල් බිංදු, ආදී ජ්‍යාමිතික හැඩතල අතර විශේෂිතය. පුස්කොළ කම්බාවේ හතර වාටියේ බැවුම් ලිස්තරවල වාටි මෝස්තර වේ. ඇත්කඳ විහාර පුස්කොළ ලේඛන එකතු වේ. මෝස්තරවල හැඩය අනුව ජ්‍යාමිතික ද්විමාණ හා නිර්මාණ ලෙස ද වර්ග කළ හැකිය. ලියවැල් මෝස්තර විශේෂ වේ. වැලක ස්වරූපය ඇති ලාලිත්‍ය රටාව කොළ මල් හා රිකිල පිහිටීමේ ජ්‍යාමිතික ස්වරූපයට නිර්මාණය කොට ඇත. බොහෝ විට ලියවැල් තනිපට හෝ දෙපට විහිදුවන මල් හෝ රිකලිවලින් එකිනෙකට පටලවා නිර්මාණය කර ඇත. සමහර විට ඒවා අතු, කොළ, මල් සහිතව තනි වැලක් ලෙසද දක්වා ඇත. මෝස්තර සඳහා වර්ණ භාවිතයේ විවිධත්වයක් දක්නට ඇත. මෙම සම්ප්‍රදායික සිතුවම් රටා ශිල්පියාගේ පෞද්ගලික රුචිකත්වය හා දක්ෂතාව මත ඔවුනට ආවේනික රටාවලින් සරසන ලදි. පැල්මඩුල්ල රජමහා විහාරයේ ඇති පොත් කම්බා මත දැකිය හැකි ප්‍රධාන සැරසිලි මෝස්තර කිහිපයකි. ඒ ලියවැල් සහ පළාපෙති දක්නට ඇති අතර කම්බාවේ වාටිය වටා බොහෝ විට පළාපෙති මෝස්තරය යොදා ඇත. මැද කොටසේ සංකීර්ණ ලියවැල් රටා දැකිය හැකිය. මෙම පුස්කොළ පොත්වල සුවිශේෂී ලක්ෂණයක් ලෙස නාරිලතා සහ භේරුණ්ඩ පක්ෂි සිතුවම් පෙන්වාදිය හැකි අතර සබරගමු සම්ප්‍රදායට උචිත ලෙස ඇතැම් කම්බාවල භේරුණ්ඩ පක්ෂියා වැනි සත්ව රූප සහ නාරිලතා වැනි මෝස්තර සියුම්ව ඇඳ ඇත. ආගමික පුස්කොළ පොත්වල නෙළුම් මල් සහ බෝ පත් රටා බහුලව භාවිත කොට ඇත. පැල්මඩුල්ලේ පුස්කොළ පොත්වල ඇති සිතුවම් කලාව අධ්‍යයනය කිරීමෙන්, 19 වන සියවසේදී මෙරට පැවති බෞද්ධ කලා ශිල්ප ක්‍රම සහ ධර්ම ග්‍රන්ථ කෙරෙහි දැක්වූ ගෞරවය මැනවින් පැහැදිලි වේ. විශේෂයෙන්ම (පැල්මඩුල්ල විනය කර්මය) සඳහා සකස් කළ පොත්වල කම්බා ඉතාමත් කලාත්මක නිමාවකින් යුක්තය. ඒ කම්බා තුළ රාජ්‍ය ලාංඡනය හංස පූට්ටු මල් මෝස්තර ආදිය දක්නට ඇත. ඉහත තොරතුරු නිදසුන් වශයෙන් පෙන්වා දී ඇති අතර ඇතැම් පුස්කොළ පොත් තුළ කම්බා සිතුවම් දක්නට ඇත. අද වන විට නුවර ශ්‍රී දළදා මාළිගාවේ පුස්කොළ පොත් කෞතුකාගාරය සහ ජාතික කෞතුකාගාරය තුළ මෙවැනි අගනා සිතුවම් සහිත පුස්කොළ පොත් රාශියක් සුරක්ෂිතව පවතී.

## නිගමනය

පුස්කොළ කම්බා සිතුවම් කලාව යනු ලාංකේය කලාකරුවාගේ ශිල්පීය නිපුණතාව සහ බුද්ධිමය ගෞරවය මැනවින් විදහා දක්වන ක්ෂේත්‍රයකි. ධර්ම ග්‍රන්ථ හෝ වටිනා ශාස්ත්‍රීය ලේඛන ආරක්ෂා කරන අංගයක් ලෙස කම්බාව හඳුන්වාදිය හැකිය. පුස්කොළ පොතේ අන්තර්ගතයට ගරු කිරීමක් වශයෙන් කම්බාව අලංකාර කළ අතර, ඒ සඳහා දැව (ගිණිසපු, කොහොඹ, කිතුල්), ඇත්දළ හෝ ලෝහ වැනි ශක්තිමත් මාධ්‍ය භාවිත විය. සිතුවම් මඟින් පොතට පූජනීය බවක් සහ කල්පැවැත්මක් එක් කරන ලදී. ලියවැල්, පලාපෙති, හංස පූට්ටුව, නාරිලතා, බුද්ධ චරිතය, මෝස්තර, දේව රූප, සහ විවිධ ජ්‍යාමිතික මෝස්තර මෙම කුඩා ඉඩකඩ තුළ ඉතා සියුම් ලෙස සිතුවම්කරණය සිදු කොට ඇත. මෙම සිතුවම්වල ඇති සජීවී බව සහ දේශීය අනන්‍යතාව අසමසම වේ. පුස්කොළ කම්බා සිතුවම් කලාව යනු ලංකාවේ අත්කම් ශිල්පය සහ සිතුවම් කලාව මුසු වූ සුවිශේෂී ශිල්පයක් ලෙස පෙන්වාදිය හැකිය.

**ප්‍රමුඛ පද** - කම්බා සිතුවම්, නිර්මාණකරණය, නියපොතු වැඩ, පත්තිරු, පුස්කොළ

## ආශ්‍රිත ග්‍රන්ථ

ඇල්ලේපොල, දීපාංජන. (2007). *තල්පත් ලිවීම*. කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල.

කුමාරස්වාමි, ඒ. (1962). *මධ්‍ය කාලීන සිංහල කලා*. කොළඹ: සංස්කෘතික දෙපාර්තමේන්තුව.

කුලසූරිය, ඒ. (1996). *පුස්කොළ පොත් ලේඛන කලාව*. සංස්කෘතික පුරාණය, වෙළුම 1, කොළඹ: 25

පරණවිතාන, කේ. ඩී. (1996). *ශ්‍රී ලංකාවේ පුස්කොළ ලේඛන කලාවේ ආරම්භය හා විකාශනය*. කෞතුකාගාරය සතරවන කලාපය, කොළඹ: 56.

සිල්වා ද නිමල්, (2021). *සිංහල සම්ප්‍රදායේ පුස්කොළ පොත් ලිවීම*. කර්තෘ ප්‍රකාශයකි.

ලගමුව, ආරිය. (2006). *ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාව*. බත්තරමුල්ල: සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව.